0064

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ උධ්‍යයන උපාධි පාඨමාලාව
තුන්වන මට්ටම
අවසාන පරීක්ෂණය – 2009
කළමනාකරණ න්‍යාය සහ පරිචය – MCU 1201

කාලය : පැය තුනයි

දිනය: 19.02.2009 වේලාව : පෙ. ව. 9.30 – ප.ව 12.30

උපදෙස්

- ප්‍රශ්න පහකට (05) කට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01 "විවිධ කළමනාකරණ මට්ටම්හිදී කළමනාකරුවන්ගේ දක්ෂතා හා සැලසුම් වෙනස් වේ." සංවිධානයක විවිධ මට්ටම්හි ක්‍රියාකරන කළමනාකරුවන්ගේ විවිධ වූ දක්ෂතා හා සැලසුම් සාකච්ඡා කරන්න. යෝග්‍ය උදාහරණ දෙමින් ඔබේ පිළිතුරු උපස්ථම්භනය කරන්න.

02 "දේශීය මෙන්ම විදේශීය පරිසර කෙරේ අද දින ව්‍යාපාර නිරාවරණයව පවතී."

(අ) ඔබ දන්නා ව්‍යාපාරයක් කෙරේ බලපාන්නා වූ විවිධ පාරිසරික සාධක හඳුන්වා දෙන්න.

(ආ) ඉහත සඳහන් ව්‍යාපාරය පරිසර සාධක කෙරේ ප්‍රතිචාර දක්වන අයුරු පිළිබඳ ඔබගේ අදහස් / විවේචනයන් දක්වන්න.

03 "දෙපාර්තමේන්තුකරණය, කළමනාකරුවන්ගේ අවධානය යොමු කරවා ගන්නා වූ සංවිධාන ව්‍යුහයට අයත් එක් මූලිකාංගයක් වේ".

(අ) සංවිධානමය ඵලදායිතාව හා කාර්යක්ෂමතාව සහතික කරනුවස් දෙපාර්තමේන්තුකරණයේ භූමිකාව කුමක් දැයි සාකච්ඡා කරන්න.

(ආ) ව්‍යාපාර ස්ථාපනය කිරීම පිණිස පවත්නා වූ විවිධ දෙපාර්තමේන්තුකරණයන් කෙටියෙන් පහදන්න.

04 (අ) අද දින බොහෝ රටවල් ආර්ථික අර්බුදයන්ට මුහුණ දී සිටී. උපරිම ඵලදායිතාවක් සහතික කරනු පිණිස මෙම අර්බුද හමුවේ කළමනාකරුවකු සිය යටත් සේවකයින් සඳහා වූ අභිප්‍රේරණ වැඩසටහන් පරිපාලනය කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ප්‍රායෝගික උදාහරණ මගින් ඔබගේ පිළිතුරු උපස්ථම්භනය කරන්න.

(ආ) ව්‍යාපාර ආයතන පිළිබඳ එක් නායකත්ව හැසිරීම් න්‍යායයක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

05 සංවිධානයක විධිමත් මෙන්ම අවිධිමත් වුවමනාවන් සැපිරීම සඳහා සංනිවේදනය වැදගත් වන බව සැලකේ.

(අ) ව්‍යාපාරයකට අවිධිමත් සංනිවේදනයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ආ) සංනිවේදනයේ "විවිධ දිශා" ව්‍යාපාරයක් ආශ්‍රිතව පැහැදිලි උදාහරණ මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06 (අ) ප්‍රායෝගික උදාහරණ මගින් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලිය කෙටියෙන් පහදන්න.

(ආ) ඔබ දන්නා ව්‍යාපාර ආයතනයකට පාලන යාන්ත්‍රනයක ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

07 පහත සඳහන් ඒවායින් පහක් (05) පිළිබඳ කෙටි සටහන් සපයන්න.

(අ) නායකත්ව පිළිබඳ අවස්ථාවෝචිත න්‍යාය
(ආ) පාලන විධි
(ඇ) ව්‍යාපාරික සංස්කෘතිය
(ඈ) සැලසුම් ආධාරක
(ඉ) සමස්ථ තත්ව කළමනාකරණ (TQM)
(ඊ) මැක්ස්වෙබර්ගේ නිළතන්ත්‍ර වාදයේ වැදගත්කම

- හිමිකම් ඇව්රිණි -